

fka CHILDREN'S SERVICES INC

# මුල් ළමාවිය අධ්‍යාපනය සහ රැකවරණ සේවාවල දී ඔබේ දරුවාගේ හැඩගැසීමට සහාය වීම

SINHALESE

මුල් ළමාවිය අධ්‍යාපනයට ධනාත්මක ආරම්භයක් වැදගත් වේ . ඔබව සහ ඔබේ පවුලේ අයව සාදරයෙන් පිළිගැනීම,සුරක්ෂිතබව සහ සහයෝගීභාවය දැනීම වැදගත් වේ. මෙම සේවාවේ පළමු දින කිහිපයේ දී ඔබේ දරුවා වෙනත් දරුවන් දැන හඳුනා ගැනීම සහ ඔවුන්ගේ ගුරුවරුන්, අධ්‍යාපනඥයින් සහ අනෙකුත් මුල් ළමාවිය වෘත්තිකයන් සමග විශ්වාසනීය සබඳතාවක් ආරම්භ කිරීම සිදුවේ.

වික්ටෝරියා හි මුල් ළමාවිය අධ්‍යාපනය සහ රැකවරණ සේවාවන් මෙහෙයවනු ලබන්නේ වික්ටෝරියානු මුල් අවුරුදු ඉගෙනුම් සහ සංවර්ධන රාමුව (VEYLDF) මගිනි. මෙම රාමුව දරුවන්ගේ 'අනන්‍යතාවය සහ ඔවුන්ගේ පවුල් සහ සංස්කෘතික ඉතිහාසය ඔවුන්ගේ ඉගෙනීම සහ සංවර්ධනය හැඩගස් වන ලෙස අධ්‍යාපනඥයින්ට උපදෙස් ලබා දෙයි. වෘත්තිකයන් විසින් දරුවන්ගේ විශේෂ අනන්‍යතාවයන්ට ගරු කරන විට සහ ඔවුන්ව පිළිගන්නා විට දරුවන්ට ඔවුන්ව සාදරයෙන් පිළිගන්නේ යැයි හැඟෙන අතර හොඳින් ඉගෙන ගනී. (VEYLDF, 2016, pg. 12). මෙම අවබෝධය ඔවුන්ගේ නව මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනය සහ රැකවරණ සේවයේ හඳුන්වාදීම සහ හැඩ ගැස්වීමේ කාලසීමාව තුළ ඔබට සහ ඔබේ දරුවාට උපකාර කිරීමට අධ්‍යාපනඥයින් ගන්නා ප්‍රවේශය පදනම් කර ගනී.

මුල් ළමාවිය අධ්‍යාපනය සහ රැකවරණ සේවා විසින් අධ්‍යාපනඥයින් සහ පවුල් අතර පවත්වා ගන්නා සහයෝගීතා හවුල්කාරිත්වය ගුණාත්මක වැඩසටහනක පදනම ලෙස සලකයි. ආරම්භයේ සිටම ගෞරවනීය සබඳතා උසස් තත්ත්වයේ සේවාවක ශක්තිමත් දර්ශකයකි. අධ්‍යාපනඥයින් උණුසුම් බව සහ පිළිගැනීමේ ස්වභාවය මගින් ඔබේ පවුලේ භාෂා[ව] භාවිතය දිරිමත් කරනු ඇතැයි ඔබට අපේක්ෂා කළ හැකි ය.

ඔබට නිසි ලෙස දැනුම් දී ඇති බව සහතික කිරීමට සහ ඔබට වඩාත් පහසු භාෂාවෙන් ප්‍රශ්න ඇසීමට සහ වැඩිදුර තොරතුරු සෙවීමට අවස්ථාව ඇති බව සහතික කිරීමට දුරකථන කථන පරිවර්තක සේවාවක් හරහා ඔබ සමග සන්නිවේදනය කිරීම ඔස්සේ සේවාවට සන්නිවේදනය සඳහා සහාය විය හැකි ය. ඊට අමතරව, ඔබේ දරුවා සේවාව තුළ සම්බන්ධයක් සහ හැඟීමක් වර්ධනය කර ගන්නා බැවින් ඔබේ පවුලේ භාෂාව කතා කරන සහායක සේවකයෙකු කෙටි කාලයක් සඳහා ඔවුන්ට සහාය වීමට සිටිය හැකි ය.

ගුණාත්මක මුල් ළමාවිය අධ්‍යාපනය විසින් 'දරුවන්ගේ ඉගෙනීම සහ සංවර්ධනය කෙරෙහි මූලිකම බලපෑම' ලෙස පවුල හඳුනා ගනී (VEYLDF, 2016, පිටුව 9). අධ්‍යාපනඥයින් මුල් අවුරුදු වැඩසටහනට පවුලේ දායකත්වය සහ සහභාගීත්වය අගය කරන අතර එය අපේක්ෂා කරයි. මෙමගින් අධ්‍යාපනඥයින්ගේ පරිචය පිළිබිඹු කිරීම පමණක් නොව, ඉගෙනීමේ ප්‍රතිඵල ඉහළ නංවන ඔවුන්ගේ අධ්‍යාපනික සහ රැකවරණ පරිසරයන් සහ නිවෙස් පරිසරය තුළ පුද්ගලයන් අතර විශ්වාසය, ආරක්ෂාව සහ සම්බන්ධතාවය වර්ධනය කිරීමට දරුවන්ට උපකාර කරයි. සේවයට සම්බන්ධ වීමට සහ මූලික සැසිවලදී පැමිණ සිටීමට පවුල් ද දිරිමත් කරනු ලැබේ. මෙය ඔබේ දරුවාට සුරක්ෂිත බවක් දැනීමට සහ ඔබේ දරුවා ඔබ නොමැතිව මෙම සේවයේ සිටින විට එහි සිදුවන දේ ඔබට තේරුම් ගැනීමට උපකාරී වේ .

ඔබේ මුල් ළමාවිය සේවාව ඔබට සහ ඔබේ දරුවාට සේවාවට හුරු වීමට උපකාර කිරීමට එය හඳුන්වාදීමේ සැලැස්මක් ඇත. මෙයට අයත් වන්නේ;

- නිල වශයෙන් පැමිණීම ආරම්භ වීමට පෙර ඔබේ දරුවා සමග සේවාව වෙත පැමිණීම
- ඔබට සහ ඔබේ දරුවාට සුවපහසුවක් දැනීමට උපකාර කිරීම සඳහා කෙටි සැසිවලින් ආරම්භ කිරීම සහ දිගු සැසි දක්වා ඒවා ගොඩනැගීම.

*fka* Children's Services
18 Harper Street, Abbotsford VIC 3067

03 9428 4471 | fkacs@fka.org.au
www.fka.org.au | Facebook @FKACS

ඔබේ මුල් ළමාවිය අධ්‍යාපනඥයින් ඔබ සමග කාලය ගත කරන අතර ඔබ සහ ඔබේ දරුවා පිළිබඳව ප්‍රශ්න කිහිපයක් ඔබෙන් අසනු ඇත. මෙය ඔවුන්ට ඔබේ දරුවාගේ අවශ්‍යතා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දෙන අතර ඔබේ දරුවාට උපරිම ඉගෙනීමේ අවස්ථා සහ ධනාත්මක ප්‍රතිඵල ලබාදෙන වැඩසටහනක් නිර්මාණය කිරීමට ඔවුන්ට උපකාර කරයි.

මුල් ළමාවිය සේවාවක් විසින් ඔවුන් සමග බෙදා ගන්නා ලෙස ඔබෙන් ඉල්ලා සිටිය හැකි තොරතුරු සඳහා උදාහරණ වනුයේ;

- දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ තොරතුරු - ප්‍රතිශක්තීකරණ වාර්තා, වෛද්‍ය අවශ්‍යතා, රෝග හෝ අසාත්මිකතා වේ.
- නැපි වෙනස් කිරීමේ දී කැමති ක්‍රම, වැසිකිළි යාමේ කැමති ක්‍රම සහ නිවසේ දී සිදු කරන ඇතැම් පුරුදු.
- දරුවන්අනුභව ආහාර, ආහාර ගන්නා අවස්ථාවේ සිදු කරන සිරිත් විරිත්/ චර්යාවන්.
- ළමුන් විවේක ගන්නා ආකාරය/ නිදාගැනීමේ අවශ්‍යතා .
  - ඔවුන් නිදාගන්නේ තොටිල්ලේද, ඔවුන්ගේම ඇඳක ද නැත්නම් එක්ව නිදාගන්නේද?
  - ඔවුන් ප්‍රිය කරන ගීත මොනවාද?
  - ඔවුන්ට ප්‍රියතම පොතක්, විශේෂ සෙල්ලම් බඩුවක් හෝ බ්ලැන්කට්ටුවක් තිබේ ද?
  - ඔවුන් සාමාන්‍යයෙන් විවේක ගන්නේ/ නිදාගන්නේ දවසේ කුමන වේලාවක ද ?
- ඔබේ පවුලට වැදගත් වන උත්සව සහ සම්ප්‍රදායන් මොනවාද?
- ඔබ ඔවුන් සමග බෙදා ගැනීමට කැමති වෙනත් තොරතුරු අධ්‍යාපනඥයින් සාදරයෙන් පිළිගනී.
- ඔබේ දරුවා සමග සම්බන්ධ වීමට ඔවුන්ට උපකාර වන අධ්‍යාපනඥයින් විසින් දැන දැනගත යුතු ඔබ කැමති ඔබේ දරුවා පිළිබඳ තොරතුරු ද ඔබ සතුව තිබෙනු ඇත.

## ඔබේ දරුවා ඔවුන්ගේ මුල් ළමාවිය සේවයට හුරුවන විට ඔවුන්ට උපකාර විය හැකි වෙනත් ක්‍රම

- සේවාවේ ඔබේ දරුවා සමග කාලය ගත කරන්න - ඔබේ දරුවාට සේවාවේ දින චර්යාවන් පැහැදිලි කරන්න, සෙල්ලම් කරන්න, කතන්දර කියවන්න සහ ඔබේම භාෂාවෙන් ගීත ගායනා කරන්න.
- වෙනත් දරුවන් සමග සන්නිවේදනය කිරීමට ඔවුන්ට සහාය වන්න. මෙය හුදෙක් අන් අය අසල වාඩි වීමට ඔවුන්ව දිරිමත් කිරීම, වෙනත් දරුවන්ට ඔවුන්ව හඳුන්වා දීම, ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා වලට සම්බන්ධ වීම විය හැකි ය.
- ඔබේ දරුවා සහ දරුවාගේ භාෂාවම කථා කරන වෙනත් අය සමග කථා කරමින් කාලය ගත කිරීම.
- ඔබේ දරුවා සමග ඔවුන් අත්විඳින සහ දැනෙන දේ ගැන කථා කරන්න: ඔවුන්ව සහතික කර දිරිමත් කරන්න.
- ඔබේ දරුවා ඔවුන්ගේ අධ්‍යාපනඥයින් කවුද, ඔවුන්ගේ නම් සහ ඔවුන්ට යම් උපකාරයක් අවශ්‍ය නම් ඔවුන් වෙත යා හැකි බව දන්නා බව සහතික කර ගන්න. ඔබ සමග ඔවුන්ගේ අධ්‍යාපනඥයාගේ නම් පැවසීමට සහ සහාය ඉල්ලා රඟ දැක්වීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සැම විටම පිටත්ව යාමට පෙර සමුගෙන ඔබ පසුව නැවත පැමිණෙන බවට ඔබේ දරුවාට සහතික වන්න . ඔබ පිටව යාමට පෙර අධ්‍යාපනඥයෙකු සහ/හෝ වෙනත් දරුවන් සමග ක්‍රියාකාරකමක නිරත වීමට ඔවුන්ට උපකාර කිරීමෙන් ඔබේ දරුවා ඒ වෙත හුරු කිරීමට හොඳ අදහසකි.
- දරුවන්ට ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට සහ ඔවුන්ට ඇති ඕනෑම ගැටලුවකට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දීම සඳහා ඔවුන් පැමිණීමට පෙර රාත්‍රිය/උදෑසන දරුවන් සමග සේවයේ දින චර්යාවන් සහ පරිසරය පිළිබඳව සාකච්ඡා කරන්න.
- ඔබේ දරුවාගේ ගුරුවරුන් සහ අධ්‍යාපනඥයින් ඔබ සහ ඔබේ දරුවා සේවාව සමග සිටින කාලය තුළ සහාය වීමට සිටින බව මතක තබා ගන්න.

**පරිශීලන**

Department of Education and Training, 2016. *Victorian Early Years Learning and Development Framework*.